# නගරාශ්‍රිත අපරාධ ප්‍රවනතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (කොළඹ කොටුව හා පිටකොටුව නාගරික කලාප ඇසුරින්)

ඩබ්. එම්. ඩබ්.ශ්‍යාමලී,* බී. වී. එන්. විජේවර්ධන, එම්. ටී. සමරකෝන්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
wathsala.shyamali3@gmail.com

වර්තමානයේ ලොව සියලු රටවල් නාගරීකරණ ක්‍රියාවලියට මුහුණ දෙමින් සිටී. නාගරීකරණය හේතුවෙන් ඇති වූ සමාජ විසංවිධානය නාගරික සමාජය තුළ විවිධ සමාජ ප්‍රශ්නයන් නිර්මාණය වී සමාජ පර්යායට බලපෑම් කරමින් තිබෙනු නිරීක්ෂණය වේ. එම සමාජ ප්‍රශ්න අතර අපරාධ විශේෂ වන අතර මේ තත්ත්වය සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවලටද පොදු වූවකි. නගර අවට සිදු වන්නා වූ අපරාධයන් සඳහා නාගරික භෞතික සමාජ සංස්කෘතික පරිසරය කෙබඳු නැඹුරුවක් සිදු කරන්නේද? නාගරික පාරිසරික තත්ත්වයන්ට ආවේණික වූ විශේෂ ස්වභාවයක් අපරාධයන්හි පවතින්නේද අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව විය. නගරාශ්‍රිත අපරාධයන්ගේ ප්‍රවනතාව හඳුනාගැනීම සහ ඒවා විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කිරීම අරමුණු කර ගනිමින් අපරාධ වාර්තා කොට්ඨාසයේ සංඛ්‍යා දත්ත සහ ක්ෂේත්‍රයේ පොලිස් ස්ථානයන්හි අපරාධ වාර්තා අනුව වැඩිම අපරාධ ප්‍රමාණයක් වාර්තා වී ඇති කොළඹ නාගරික කලාපයේ, කොටුව සහ පිටකොටුව ආශ්‍රිතව පර්යේෂණය සිදු කෙරුණි. ද්විතියික මූලාශ්‍රය යොදා ගනිමින් 2008 සිට 2018 දක්වා වාර්තා වූ 13351ක් වූ අපරාධයන්ගේ සංඛ්‍යාත්මක දත්ත සහ ඒවායේ රටාවන් මෙහිදී විශ්ලේශනය කරන ලදි. එමෙන්ම පොලිස් නිලධාරීන් සහ ප්‍රජාව සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි. 2010 වර්ෂයේ ප්‍රදේශයේ අපරාධ ප්‍රමාණය 3000ක් වූ අතර එය 2012 වනවිට 3708ක් ලෙසටත් 2014 වනවිට 3958ක් ලෙස ක්‍රමික වර්ධනයක් හඳුනා ගැණුනි. 2017 වර්ෂය අවසාන වනවිට වාර්තා වූ අපරාධ ප්‍රමාණය 2685ක් දක්වා වූ අතර යම් අඩුවීමක් සිදු වී ඇත. කොළඹ නගරයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වන කොටුව හා පිටකොටුව ප්‍රදේශ තුළ අධික ජනගහන තදබදය, අක්‍රමිකව ඉදිවන සේවා හා වෙළඳ ආයතන, රැකියා සංක්‍රමණික කණ්ඩායම් දැකිය හැකිවේ. සිය අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහ අනන්‍යතාවය සඟවා කටයුතු කළ හැකි පරිසරයක් නාගරිකබව තුළ තිබීම මත අපරාධ කෙරෙහි යොමුව මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය, මිනීමැරීම්, මංකොල්ලකෑම් සහ ස්ත්‍රී දූෂණ ආදී අපරාධ සිද්ධීන් ඒ අතර ප්‍රධාන වී ඇත. තරුණ කල්ලි අපරාධකරුවන් අපරාධ සිදු කිරීමේ වැඩි නැමියා ඇත්තවුන් වූහ. පටු මංමාවත්, ගරා වැටුණු ගොඩනැගිළි තුළ සහ අපරාධ කිරීම සඳහා නිර්මාණය කරගත් ඇතැම් ස්ථාන (Hotspot) මූලික කරගෙන අපරාධයන් බහුලව සිදුවන බව නිරීක්ෂණය විය. නගරාශ්‍රිතව අපරාධ පාලනය කිරීමෙහිලා නගර සැලසුම්කරණ ක්‍රියාවලිය නිසි පරිදි සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. ලෝකයේ බොහෝ රටවල් වර්තමානයේ පාරිසරික සැලසුම් මඟින් අපරාධ වැළැක්වීමේ ක්‍රමය (CPTED) යොදා ගනිමින් නාගරික අපරාධ වැළැක්වීමට පියවර ගෙන ඇත. එකී ක්‍රමය කොළඹ නාගරික සැලසුම්කරන ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම කාලෝචිතය.

**මුඛ්‍යපද-** අපරාධ; අපරාධ ප්‍රවනතාව; නාගරීකරණය; සමාජ විසංවිධානය